පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක :- 2010/04

NCP/CS/PT/AP/FM/05
පළාත් භාණ්ඩාගාරය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2010.01.19

සියළුම ආදායම් ගණන් දීමේ නිළධාරීන් වෙත.

<u>ආදායම් ගිණුම් - 2009</u>

එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සියළුම ආදායම් ගණන් දීමේ නිළධාරීන් විසින් තමන් ගණන් දෙනු ලබන ආදායම් කාණ්ඩය වෙනුවෙන් පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයේ රී 97.5 වගන්තියට අනුව වාර්ෂික ආදායම් ගිණුමක් සකස් කර එය ඊළඟ එළඹෙන වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර පිටපත් 03 කින් යුතුව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව 2009 වර්ෂයේ වාර්ෂික ආදායම් ගිණුම මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් වලට අනුකූලව සකස් කර සහතික කිරීමෙන් අනතුරුව 2010 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

01 2009 මුදල් ප්‍රකාශයෙන් ඔබ වෙත පැවරී ඇති ආදායම් සංකේතාංක සඳහා වූ ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම් කර ගනිමින් මේ සමඟ අමුණා ඇති ඩී.ජී.එස්.ඒ- ආදායම් 1 හා 2 ආකෘති පත්‍ර භාවිතා කර එක් එක් ආදායම් සංකේතය සඳහා වෙන් වෙන්ව 2009 වර්ෂය සඳහා ආදායම් ගිණුම පිළියෙල කල යුතුය.

02 ඩී.ජී.එස්.ඒ- ආදායම් 2 ආකෘතියෙහි සඳහන් අයිතම අංක යටතේ ආසන්න පසුගිය වර්ෂ 3 ට අදාළ අනුරූපි සංඛ්‍යා ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ. එබැවින් අදාළ සංකේතයන් යටතේ ඒ ඒ වර්ෂයට අදාළ නිවැරදි ආදායම් සංඛ්‍යා දැක්වීම තහවුරු වීම පිණිස එකී වර්ෂවලට අදාළ අනුරූපී ආදායම් සංකේත නිවැරදිව නිශ්චය කරගන්නා ලෙසත් 2009 වර්ෂයේ ආදායම් ගිණුමේ ඇතුළත් සංඛ්‍යාවන් 2009 වර්ෂය සඳහා නිකුත් කෙරෙන ***පළාත් භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශණයේ දැක්වෙන සංඛ්‍යාවන්ට සමාන වන බවට වගබලා ගන්නා ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.***

03 ඒ - 4 ප්‍රමාණයේ කඩදාසියේ සඳහන් කර ඇති පරිදි ඩී.ජී.එස්.ඒ- ආදායම් ආකෘති 1 සිට 2 (DGSA-Revenue -1& 2) යොදා ගනිමින් භාෂාත්‍රයෙන් තනි ලේඛණයක් ලෙස ආදායම් ගිණුම පිළියෙල කල යුතු අතර නිරවද්‍යතාව පිළිබඳව මුල්‍ය හා ගිණුම් අංශය භාර ප්‍රධානියා විසින් පෞද්ගලිකවම තහවුරු කිරීමෙන් අනතුරුව ආදායම් ගනන්දීමේ නිළධාරියා විසින් සහතික කරන ලදුව ඒවා අදාළ අමාත්‍යංශ ලේකම්

හරහා 2010 මාර්තු 31 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පිටපත් 03 කින් මටද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. ගිණුම සහතික කිරීමේදී ආකෘති පත්‍ර වලින් අපේක්ෂා කරන සියලුම තොරතුරු සඳහන් කර ඇති බවට වග බලා ගන්නා ලෙස ද ඉල්ලා සිටිනු ලැබේ.

04 ඩී.ජී.එස්.ඒ - ආදායම් ආකෘති 1 හා 2 (DGSA-Revenue -1 & 2) ආකෘතින් විද්‍යුත් මාධ්‍යයෙන් පලාත් භාණ්ඩාගාරයේ තබා ඇති අතර අවශ්‍ය නම්, 025-2234400 අංකයෙන් අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) අමතා මෘදුකාංග තැටියක් (FLOPPY DISKETTE) එවීමෙන් හෝ ඔබේ විද්‍යුත් තැපැල් අංකය ලබා දීමෙන් හෝ www.ncp.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ එම තොරතුරු ලබා ගත හැක.

05 විගණකාධිපති විසින් විගණනය කරන ලද ආදයම් ගිණුම්වල පිටපත් පහත සඳහන් ආකාරයට බෙදා හැරෙනු ඇත.

| | | |
|---|---|---|
| 1. මුල් පිටපත | - | පලාත් භාණ්ඩාගාරයේ ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව |
| 2. දෙවන පිටපත | - | අදාල අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව |
| 3. තුන්වන පිටපත | - | විගණකාධිපති විසින් රඳවා ගනු ලැබේ. |

අවසාන ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේදී දෝෂ වලින් තොරවිය යුතු අතර එම ගිණුම් සකස් කිරීමේදී මීට පෙර එවා ඇති විගණන විමසුම්වලට හා විගණකාධිපති වාර්තා වලට අවධානය යොමු කොට එමගින් නිරීක්ෂිත අඩුපාඩු වලක්වා ගනිමින් නිවැරදිව ගිණුම් සකස් කර 2010.03.31 වෙනි දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සියළුම ප්‍රධාන ගණන් දීමේ නිළධාරීන් හා මෙයට සහය වන අනෙකුත් සියළුම නිළධාරීන්ගේ වගකීමක් වන අතර එම වගකීම නිසිපරිදි ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**ඒ.තලාකොටුනගේ,**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

| | | |
|---|---|---|
| 01. සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් | - | දැ.පි. |
| 02. විගණකාධිපති | - | දැ.පි. |
| 03. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන හා විමර්ශන අධ්‍යක්ෂ) | - | දැ.පි. |